**ශීර්ෂය - 225 පොලිස් දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2016 වර්ෂය**

ශීර්ෂය 225- පොලිස් දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජූනි 27 දින පොලිස්පතිවරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙළ කිරීම හා සාධරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

### 2.1 විසර්ජන ගිණුම

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 63,604.89 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 58,852.28 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 4,752.61 ක් හෙවත් සියයට 7.47 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 58,548.50 | 55,802.51 | 2,745.99 | 4.69 |
| මූලධන | 5,056.39 | 3,049.77 | 2,006.62 | 36.68 |
| **එකතුව** | **63,604.89** | **58,852.28** | **4,752.61** | **7.47** |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 22501 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 1,200.00 | 1,034.30 | 1,350.00 | 1,413.30 | 2,000.00 | 1,384.99 |

## 2.3 අග්‍රිම ගිණුම්

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 7002/0000/00/0031/0016/000 දරන අග්‍රිම ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 1.02 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම්

දෙපාර්තමේන්තුව යටතේ වන තැන්පත් ගිණුම් 4 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 337.31 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. මිලියන |
| 6000/0000/00/0001/0062/000 | 9.78 |
| 6000/0000/00/0013/0050/000 | 29.81 |
| 6000/0000/00/0016/0032/000 | 296.55 |
| 6000/0000/00/0018/0040/000 | 1.17 |
| **එකතුව** | **337.31** |

## 2.5 විගණන නිරීක්ෂණය

පොලිස් දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙළ කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 විසර්ජන ගිණුම

**අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 3 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.මිලියන 583 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

(ආ) වැය විෂයයන් 12 ක් සඳහා අධිප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 14 ක සිට සියයට 78 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

### 3.2 පොදු තැන්පත් ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 2 ක් ඉක්මවූ රු. මිලයන 11.5 ක තැන්පතුවක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් විශ්‍රාම වැටුප් කාර්යන් සඳහා ලබා දී තිබුණු රු.මිලියන 0.64 ක් අදාළ කාර්යභාරයන් ඉටු නොකර තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

### 3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබද සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 22501 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව 2016 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.මිලියන 113.13 ක් වී තිබුණි. එම හිගහිටි ණය ශේෂවලින් නිලධාරින් 4,616 දෙනෙකුගෙන් අය විය යුතු වර්ෂ 3 කට වැඩි කාලයක සිට පැවැත එන එකතුව රු. මිලියන 72.24 ක හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට පොලිස් දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ ණය පාලන ගිණුමේ ණය ශේෂය හා කොට්ඨාශ කාර්යාල විසින් පිළියෙල කර තිබූ කේවල ශේෂ වර්ගීකරණය අනුව ණය ශේෂය අතර හඳුනා නොගත් රු. මිලියන 3.84 ක වෙනසක් පැවතුණි.

(ඇ) පොලිස් දෙපාර්තමේන්තුවේ පොත් සහ භාණ්ඩාගාර පොත් අතර රු.140,890 ක වෙනසක් පැවතුණි.

(ඈ) 2010 වර්ෂයේදී ත්‍රිකුණාමලය පොලිස් අධිකාරි කාර්යාලයේ ආපදා ණය ඉල්ලුම් කරන ලද පොලිස් නිලධාරීන් 16 කගේ ණය ඉල්ලුම් පත්‍ර කූට ලෙස වෙනස් කර රු. මිලියන 1.27 ක් වටිනා චෙක්පත් ලබාගෙන සාපරාධී සාවද්‍ය පරිහරණය කිරීම සම්බන්ධයෙන් අධිකරණ

ක්‍රියාමාර්ග ගෙන තිබුණු අතර එහි වර්තමාන තත්ත්වය විගණනය වෙත වාර්තා කර නොතිබුණි.

(ඉ) පොළොන්නරුව පොලිස් අධිකාරි කාර්යාලය මගින් 2012 ජුනි මාසයේ සිට නිලධාරීන් 07 දෙනෙකු සඳහා රු. මිලියන 1.22 ක ආපදා ණය නිකුත් කර තිබුණි. එම ණය ලබා ගත් නිලධාරීන් සහ ණය ශේෂයන් සම්බන්ධයෙන් ගැටලු සහගත තත්ත්වයක් ඇති වී තිබුණි. මේ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් පරීක්ෂණයක් සිදු කරමින් පැවති අතර එහි වර්තමාන තත්ත්වය විගණනයට වාර්තා කර නොතිබුණි.

**3.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව පොලිස් දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2017 ජුනි 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**3.5 වත්කම් කළමනාකරණය**

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 756 ප්‍රකාර පැවැත්විය යුතු වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සමාලෝචිත වර්ෂය වෙනුවෙන් බස්නාහිර හා උතුරු පළාත් තුළ 2017 ජුලි මාසය අවසාන වන විටත් පවත්වා නොතිබුණි.

**3.6 කාර්යසාධනය**

2016 වර්ෂයේ පොලිස් දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) අපරාධ විසඳීමේ ප්‍රගතිය**

සියළුම අපරාධ, නීති විරෝධී ක්‍රියා හා මහජන සාමය කඩවීමට තුඩුදිය හැකි ක්‍රියාවන් වැලැක්වීම පොලිස් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වි තිබුණි.රට තුළ අපරාධ වාර්තාවීම්වල නිරපේක්ෂ ප්‍රමාණය හා වාර්තා වූ අපරාධ විසඳීමේ සාපේක්ෂ අගය දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබිඹු කරන ප්‍රධාන දර්ශකයක් වී තිබුණි. ඊට අදාළව සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයේ තොරතුරු පහත දැක්වේ.

| අපරාධ වර්ගය | 2016 වර්ෂය | | | 2015 වර්ෂය | | |
|---|---|---|---|---|---|---|
| | වාර්තාවීම් | විසඳීම් | විසඳීමේ ප්‍රතිශතය | වාර්තා වීම් | විසඳීම් | විසඳීමේ ප්‍රතිශතය |
| බල අපරාධ | 36,937 | 26,869 | 72.74 | 40,188 | 23,575 | 58.66 |
| සුළු වැරදි පුද්ගලයන්ට එරෙහි | 45,579 | 30,481 | 66.87 | 43,870 | 30,292 | 69.05 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| සුළු වැරදි දේපලවලට එරෙහි | 33,349 | 15,969 | 47.88 | 30,685 | 14,407 | 46.95 |
| ළමයින්ට එරෙහි අපරාධ | 5,709 | 3,294 | 57.70 | 5,911 | 5,102 | 86.31 |
| කාන්තාවන්ට එරෙහි අපරාධ | 9,042 | 4,986 | 55.14 | 8,288 | 4,579 | 55.25 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අපරාධ විසඳීමේ ප්‍රගතිය සැකකරුවන් අත්අඩංගුවට ගැනීම මත හඳුනාගෙන ඇති අතර සුළු වැරදි විසඳීමේ ප්‍රගතිය පොලීසිය, සමථ මණ්ඩලය හෝ නඩු පැවරීමෙන් හෝ විසඳුම් ලබා අවසන් කළ ප්‍රමාණය මත හඳුනාගෙන තිබුණි. වර්ෂයකට පොලිස් ස්ථාන වෙත මිලියනය ඉක්මවා කෙරෙන සුළු පැමිණිලි විසඳීමේ ප්‍රගතිය සියයට 95 ක් ඉක්මවා තිබුණද, අපරාධ හා සුළු වැරදි විසඳීම ඉහත පරිදි අඩු ප්‍රගතියක් පෙන්නුම් කර තිබුණි.

(ii) ඉකුත් වර්ෂයේ විසඳී නොතිබුණු පැමිණිලි සම්බන්ධ තොරතුරු ඉදිරියට ගෙන ඒමේ ක්‍රමවේදයක් නොතිබුණු බැවින්, ඉකුත් වර්ෂයේ වාර්තා වූ පැමිණිලිවලින් 2016 දෙසැම්බර් 31 දිනට සත්‍ය වශයෙන් විසඳා නොතිබුණු පැමිණිලි සංඛ්‍යාව අනාවරණය වී නොතිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට අදාළව විසඳා නොතිබුණු අපරාධ සම්බන්ධව පසු විපරම් ක්‍රියාවලියද දුර්වල වී තිබුණි.

**(ආ) රථවාහන පාලනය හා මාර්ග ආරක්ෂාව**

රථ වාහන පාලනය හා මාර්ග ආරක්ෂාව සලස්වමින් අනතුරු වැලැක්වීම පොලිස් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වන අතර ශ්‍රී ලංකාව තුළ 2015 හා 2016 වර්ෂවලට අදාළව වාර්තා වූ මාර්ග අනතුරු පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | **2016** | **2015** |
|---|---|---|
| මාරක අනතුරු සංඛ්‍යාව | 2,824 | 2,600 |
| බරපතල තුවාල අනතුරු සංඛ්‍යාව | 8,148 | 8,186 |
| සුළු තුවාල අනතුරු සංඛ්‍යාව | 14,604 | 13,595 |
| අලාභ අනතුරු සංඛ්‍යාව | 13,380 | 13,726 |
| **මුළු අනතුරු සංඛ්‍යාව** | **38,956** | **38,107** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මාරක අනතුරුවලින් මියගිය සංඛ්‍යාව 2015 වර්ෂයේදී 2816 ක් වූ අතර 2016 වර්ෂයේදී 3017 දක්වා වැඩිවී තිබුණි.

(ii) 2014, 2015 හා 2016 යන වර්ෂ තුනේදී වාර්ෂික මාරක රිය අනතුරු සංඛ්‍යාව සියය ඉක්මවූ පොලිස් කොට්ඨාශ ලෙස අනුරාධපුර, කුරුණෑගල, ගම්පහ, කැලණිය, හා රත්නපුර වාර්තාවී තිබුණි. මහනුවර, නුගේගොඩ, මාතර හා තංගල්ල යන පොලිස් කොට්ඨාශ තුළද 2016 වර්ෂයේ වාර්තා වී තිබුණු මාරක රිය අනතුරු සංඛ්‍යාව සියය ඉක්මවා තිබුණි.

(iii) 2014, 2015 හා 2016 යන වර්ෂ තුනේදීම පොලිස් කොට්ඨාශ 08 ක බරපතල රිය අනතුරු සංඛ්‍යාව තුන්සීය ඉක්මවා තිබුණි. පොලිස් කොට්ඨාශ 41ක් අතරින් එම පොලිස් කොට්ඨාශ 8 තුළ සිදුවී තිබුණු බරපතල රිය අනතුරුවල ප්‍රතිශතය මුළු බරපතල රිය අනතුරුවලට සාපේක්ෂව ඉකුත් වර්ෂයේදී සියයට 39.5 ක සිට සමාලෝචිත වර්ෂයේදී සියයට 43.8 ක් දක්වා වැඩිවී තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයේදී සිදුවී තිබූ සැකකරුවන් හඳුනා නොගත් රථවාහන අනතුරු (අනතුරු සිදුකර පලාගිය) සංඛ්‍යාව 2,097 ක් වී තිබුණි. ඉන් මාරක රිය අනතුරු 81 ක් වූ අතර බරපතල අනතුරු සංඛ්‍යාව 168 ක් වී තිබුණි.

**(ඇ) නීති විරෝධී නිද්‍රාජනක ද්‍රව්‍ය වාර්තා වීම, අත් අඩංගුවට ගැනීම හා නඩු පැවරීම**

දිවයින තුළ නීති විරෝධී නිද්‍රාජනක ද්‍රව්‍ය (හෙරොයින්, ගංජා, හෂිස්, කොකේන්, වෙනත්) පොලිස් මත් ද්‍රව්‍ය නාශක කාර්යාංශය හා පොලිස් ස්ථාන සම්බන්ධ පසුගිය වර්ෂ දෙකක දත්ත පහත දැක්වේ.

| ආයතනය | අත් අඩංගුවට ගත් කිලෝ ග්‍රෑම් (Kg) ප්‍රමාණය | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | හෙරොයින් | | ගංජා | | හෂිස් | | කොකේන් | |
| | 2015 | 2016 | 2015 | 2016 | 2015 | 2016 | 2015 | 2016 |
| පොලිස් මත් ද්‍රව්‍ය නාශක කාර්යාංශය | 22.62 | 147.73 | 196.32 | 108.32 | - | 4.69 | - | 1,486.30 |
| පොලිස් ස්ථාන | 16.61 | 48.72 | 5,481.14 | 3,531.82 | 1.29 | 35.61 | 0.19 | 1.55 |
| **එකතුව** | **39.23** | **196.45** | **5,677.46** | **3640.14** | **1.29** | **40.3** | **0.19** | **1487.85** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේදී පොලිස් මත්ද්‍රව්‍යය නාශක කාර්යාංශය විසින් අත් අඩංගුවට ගෙන තිබූ කොකේන් තොගයේ තොග මිලෙහි සාමාන්‍ය වටිනාකම රු. මිලියන 22,294.5 ක් වී තිබුණි.

(ii) හෙරොයින් මත්ද්‍රව්‍යය සම්බන්ධයෙන් අත් අඩංගුවට ගත් ප්‍රමාණය ඉකුත් වර්ෂයේ 26,539 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී 27,458 ක් දක්වා වැඩි වී තිබුණි. අත් අඩංගුවට ගත් සැකකරුවන් හා හෙරොයින් ප්‍රමාණය වර්ධනයවීම අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව රටතුළ සංසරණය වී තිබූ හෙරොයින් ප්‍රමාණය ඉහල අගයක් ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේ අත්අඩංගුවට ගත් ප්‍රමාණයේ තොග මිලෙහි සාමාන්‍ය වටිනාකම රු.මිලියන 982.25 ක් වී තිබුණි.

## 3.7 අනාර්ථික ගනුදෙනු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නාරාහේන්පිට පොලිස් රෝහලේ අංක 1 ඖෂධ ගබඩාවේ රු.483,899 ක් වටිනා ඖෂධ අයිතම් 152 ක් හා වටිනාකම අනාවරණය නොවූ තවත් ඖෂධ අයිතම් 85 ක් කල් ඉකුත් වූ ඖෂධ වශයෙන් ගබඩාකර තිබුණි. තවද ඒවා ගබඩා කර තිබුණේ භාවිතයට ගනු ලබන ඖෂධ තොග ගබඩාව තුළම බව නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය විය.

(ආ) පොලිස් රෝහලේ දෛනික මිලදී ගැනීම් අංශය විසින් නිශ්චිතව නම් කරන ලද රෝගීන් වෙනුවෙන් මිලදී ගෙන තිබූ රු.753,789 ක් වූ ඖෂධ මාස 03 කට වැඩි කාලයක් ඉක්මවාගොස් තිබුණද, අදාළ රෝගීන් ඒවා රැගෙන නොයාම නිසා දෛනික මිලදී ගැනීම් ගබඩාවේ 2017 මාර්තු 31 වන විටත් රඳවාගෙන තිබුණි.

## 3.8 කළමණාකරන දුර්වලතා

---------------------------

**පොලිස් වෛද්‍ය සේවා කොට්ඨාශය**

---------------------------------------

පොලිස් වෛද්‍ය සේවා කොට්ඨාශය තම කාර්යයන් ඉටු කිරීම සඳහා විවිධ වූ අංශ 23 ක් යටතේ ක්‍රියාත්මක වන අතර රෝහලේ අභ්‍යන්තර ක්‍රියාකාරිත්වය වෛද්‍ය පරිපාලනය හා සාමන්‍ය පරිපාලනය වශයෙන් ප්‍රධාන කොටස් දෙකක් යටතේ ක්‍රියාත්මක වේ. වෛද්‍ය පරිපාලනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වෛද්‍ය පරිපාලනයේ අභ්‍යන්තර පාලනය ඉතා දුර්වල මට්ටමක පැවතුණි. පොලිස් රෝහලට බෙහෙත් ද්‍රව්‍ය සහ ශල්‍ය උපකරණ මිලදී ගැනීම, බෙදා හැරීම සහ ගබඩා කිරීම දුර්වල පාලන ක්‍රමයන් පැවැතිම නිසා 2016 ජුනි 30 දින රෝහල් කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකු විසින් රු.611,552 ක ඖෂධ අයිතම් 40 ක් සොරකම් කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 286.7 ක ඖෂධ පොලිස් රෝහල සඳහා මිලදී ගෙන තිබුණු අතර ඖෂධ ගබඩාවලට ඇණවුම් කිරීම, ඖෂධ තොග ලබා ගැනීම හා ඖෂධ රෝගීන් සඳහා නිකුත් කිරීම වැනි ප්‍රධාන කාර්යන් සඳහා පවත්වා ගත යුතු ලේඛන දෛනිකව යාවත්කාලීන කිරීම ඉතාම දුර්වල තත්ත්වයක පැවතුණි.

## 3.9 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජාතික පොලිස් අධ්‍යයන පීඨය සංවර්ධනය කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී සහ ඉකුත් වර්ෂ 2 කදී රු.මිලියන 1,374 ක ප්‍රතිපාදන සලසා තිබුණද, ඒ සඳහා එකතුව රු.මිලියන 131 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය නිම කිරීම ප්‍රමාද වෙමින් පැවතුණි. තවද, සමාලෝචිත වර්ෂයේදී ජාතික පොලිස් අධ්‍යයන පීඨය සංවර්ධනය කිරීම යටතේ කටාන ජාතික පොලිස් අභ්‍යාස ආයතනයේ හා කළුතර පොලිස් පුහුණු පාසලෙහි පරිපාලන ගොඩනැගිලි, නේවාසිකාගාර, ක්‍රීඩා පිටි, ශ්‍රවණාගාර හා අභ්‍යන්තර මාර්ග පද්ධති ඉදිකිරීම ඇතුළු ව්‍යාපෘති 16 ක් ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එම ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණු අතර සලසා තිබුණු රු.මිලියන 800 ක ප්‍රතිපාදනවලින් රු. මිලියන 600 ක් වෙනත් වැය විෂයන්ට මාරු කිරීමෙන් පසු ඉතිරි රු.මිලියන 200 ක ප්‍රතිපාදනවලින් සියයට 22 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

(ආ) පොලිස් තොරතුරු හා සංනිවේදන ජාලය දියුණු කිරීම සඳහා රු. මිලියන 500 ක් ද, පරිගණක ජාලගතකරණය සංවර්ධනය කිරීම යටතේ ව්‍යාපෘති 05 ක් සඳහා රු.මිලියන 250 ක් ද, වශයෙන් පොලිස් දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ ශක්‍යතාවය වර්ධනය කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී ප්‍රතිපාදන ලබාදී තිබුණි. ඉන් පළමු ව්‍යාපෘතියේ රු. මිලියන 500 ක් හා දෙවන ව්‍යාපෘතියෙන් රු.මිලියන 157 ක් වර්ෂය අවසානයේ ඉතිරිවී තිබුණි. පොලිස් තොරතුරු හා සංනිවේදන ජාලය සඳහා සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂ දෙකකදී එකතුව රුපියල් මිලියන 1,775 ක ප්‍රතිපාදන ලබාදී තිබුණද ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 5 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

(ඇ) පොලිස් ස්ථානවල පෙරසවි ගොඩනැගිලි ඉදිකිරීම් ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 485 ක ප්‍රතිපාදන සළසා තිබුණි. එම ව්‍යාපෘතිය පහත සඳහන් පරිදි අදියර 03 ක් යටතේ ක්‍රියාත්මක කර තිබුණි.

| අදියර | 2016 වර්ෂය සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනය | 2016 වර්ෂයේ වියදම | වියදමේ ප්‍රතිශතය |
|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | |
| (1) ගොඩනැගිලි 177 | 50 | 1.71 | 3.42 |
| (2) ගොඩනැගිලි 300 | 285 | 152.12 | 53.38 |
| (3) ගොඩනැගිලි 75 (විශේෂ කාර්ය බලකායෙන් ලද) | 150 | 105.20 | 70.13 |
| **එකතුව** | **485** | **259.03** | **53.41** |

2

014 වර්ෂයේදී චීනයෙන් ආනයනය කර තිබූ එම පෙරසවි ගොඩනැගිලි කොටස් යොදා නිම කිරීමට නියමිත ගොඩනැගිලි ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත වියදම රු. මිලියන 2,542.80 ක් වී තිබුණි. 2016 දෙසැම්බර් 31 දින වන විට මුළු වියදම රු. මිලියන 1,647.20 ක් විය. සමාලෝචිත වර්ෂයේදී මෙන්ම ඊට පෙර වර්ෂවලදී ද අපේක්ෂිත ඉලක්ක කරා ලඟා නොවීම මත මෙම ව්‍යාපෘතිය අවසන් කිරීම ප්‍රමාද වෙමින් පැවතුණි.

## 3.10 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 837 | 469 | 368 |
| (ii) | ද්විතීක මට්ටම | 4,301 | 3,226 | 1,075 |
| (iii) | තෘතීයික මට්ටම | 88,392 | 74,771 | 13,621 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 2,565 | 1,559 | 1,006 |
| | **එකතුව** | **96,095** | **80,025** | **16,070** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පොලිස් සහායක සේවාවේ පොලිස් වෛද්‍ය සේවා කොට්ඨාශය සඳහා අනුමත තනතුරු 11 ක් සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුමත කරවාගෙන නොතිබුණි.

(ආ) වෛද්‍ය රසායනාගාර කාර්මික විශේෂඥ තනතුරේ අනුමත සංඛ්‍යාව 45 ක් වුවද, තථ්‍ය සංඛ්‍යාව 9 ක් විය. මේ නිසා 2014 වර්ෂය දක්වා පැය 24 පුරා ක්‍රියාත්මකව පැවති පොලිස් රෝහලේ රාසායනාගාර පරික්ෂණ කටයුතු සිදුකරන වේලාවන් සතියේ දිනවල පැය 12 ක් හා සති අන්ත දිනවල පැය 08 ක් දක්වා සීමා කිරීමටත්, පරික්ෂණ කටයුතු පුද්ගලික ආයතන මගින් සිදු කර ගැනීමටත් සිදු වී තිබුණි.